**මැලේසියාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස්වරයාට ප්‍රහාරයක්**

මැලේසියාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස්වරයාට අද එනම් 2016 සැප්තැම්බර් 4 වැනි දින කුවාලා ලාම්පූර් ජාත්‍යන්තර ගුවන්තොටුපළේදී පුද්ගලයන් කණ්ඩායමක් විසින් පහරදී ඇති බවට වූ වාර්තා විදේශ කටයුතු අමාත්‍යාංශය තහවුරු කරයි.

මැලේසියාවේ ශ්‍රී ලංකා මහ කොමසාරිස්වරයාට එල්ල කළ මෙම ප්‍රචණ්ඩකාරී ප්‍රහාරය ශ්‍රී ලංකා රජය දැඩිලෙස හෙළා දකියි.

මහ කොමසාරිස්වරයා වෛද්‍ය ප්‍රතිකාර ලබා ගනිමින් සිටියි.

කුවාලා ලාම්පූර්හි පිහිටි ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය, වැරදිකරුවන් හඳුනා ගැනීම සඳහා සහ විමර්ශන කටයුතුවලට සහාය ලබා දීම සඳහා මැලේසියාවේ නීතිය බලාත්මකිරීමේ බලධාරීන් හා මීට අදාළ වෙනත් බලධාරීන් සමඟ කටයුතු සම්බන්ධීකරණය කරමින් සිටියි. ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍යාංශය, මෙම සිදුවීමේ බරපතලකම අවබෝධ කරගන්නා අතර මේ සම්බන්ධයෙන් රාජ්‍යතාන්ත්‍රික මාර්ග ඔස්සේ ගතයුතු සියලු පියවර ගනු ලබමින් සිටියි.

ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශය
කොළඹ.
2016 සැප්තැම්බර් 4 වැනි දින